# නව සහශ්‍රයේ පුස්තකාලය
## සම්ප්‍රදායික පුස්තකාල හා සන්සන්දනාත්මක අධ්‍යයනයක්.

ඩබ්.එම්.ඒ.කේ. විජේකෝන්

### හැඳින්වීම

නව සහශ්‍රය මානව සමාජ සංවර්ධනයේ අභිනව සංක්‍රාන්තික අවධියකි. තාක්ෂණවේදයේ ප්‍රවර්ධන සමස්ත සමාජ ක්‍රියාවලිය නව දිසානතියකට යොමු කරනු ලැබ ඇත. "මේ අනුව වත්මන් සමාජය සාම්ප්‍රදායික සමාජ සබැඳියා අතික්‍රමණය කරමින්, ඉතා සංකීර්ණ අධි මානව සමාජ සම්බන්ධතා ජාලයක් බවට පත් වෙමින් පවති. ඒ තුළ මාර්ෂල් මැක්ලුහන්ගේ විශ්ව ගම්මානය (Universal Village), ආතර් සී. ක්ලාක්ගේ විශ්ව පවුල (Universal Family) ටොෆ්ලර්ගේ විද්‍යුත් කුටි (Electronic Cottages) (වීරසිංහ,2002, පි. vii) වැනි සංකල්ප සමාජගත යථාර්ථ බවට පත් වෙමින් පවති.

මෙම පසුබිම තුළ කියවීම, අධ්‍යයනය, විමර්ශනය, පර්යේෂණය පරිශීලනය සඳහා පොත්පත් එක් රැස්කර, ආරක්ෂා කර, සංවිධානය කර, බෙදා හරින මධ්‍යස්ථානය (Corea, 1993, p.1790) ලෙස අර්ථ ගත සම්ප්‍රදායික පුස්තකාලය සංකල්පමය, ව්‍යුහමය, තාක්ෂණික ආදි වශයෙන් පරිණාමය වෙමින් තිබේ. මේ අනුව කාලානුරූපීව පවත්නා තාක්ෂණයේ සිදුවන වෙනස්කම් සාපේක්ෂව පුස්තකාල තොරතුරු මාධ්‍ය සහ පුස්තකාල තොරතුරු මෙහෙයවීම් ක්‍රියාවලියේ වෙනස්කම් දක්නට ඇත. ඒ අනුව පුස්තකාල තොරතුරු මාධ්‍ය ගල්, මැටි පුවරු, පැපිරස්, පාර්ච්මන්ට්, වෙලම් හා පුස්කොළ ආදී ප්‍රාථමික මාධ්‍යවල සිට කඩදාසි, ශ්‍රව්‍ය දෘශ්‍ය, සූක්ෂ්ම රූපණ, ඉලෙක්ට්‍රොනික හා අතථ්‍ය යනාදි විවිධ මාධ්‍ය ස්වරූප වශයෙන් සමාජගතව ඇත.

මුල් කාලීනව පුස්තකාල තොරතුරු මාධ්‍ය ඉදිරිපත් කිරීමට පමණක් උපයෝජිත වූ තාක්ෂණය, පසුකාලීනව තොරතුරු මාධ්‍යය ගබඩා කිරීම, ආරක්ෂා කිරීම, විශ්ලේෂණය, සංවිධානය, සමුද්ධරණය හා පරිවහනය යනාදිව තොරතුරු මෙහෙයවීම් ක්‍රියාවලිය සඳහා ද යොදා ගනු ලැබිණි. මෙම පසුබිම මත තාක්ෂණික විභවතා සහ සමාජ අවශ්‍යතා සාපේක්ෂව ගතික සංවිධානයක් ලෙස පුස්තකාලයේ ඇති වූ විවිධ ස්වරූප සහ විවිධ මෙහෙයවීම් ක්‍රියාවලි අවධි කිහිපයක් යටතේ අධ්‍යයනයට යොමු කළ හැකිය (Buckland, 1998).

## කඩදාසි පුස්තකාල අවධිය (Period of paper library)

පුස්තකාල තොරතුරු මාධ්‍යය ලෙස කඩදාසි හා කාඩ්බෝර්ඩ් මාධ්‍යය ...තයට ගැනුණි. කඩදාසි තාක්‍ෂණය (Paper Technology) මූලික තාක්‍ෂණවේදය ලෙස භාවිතා විය. තොරතුරු නිෂ්පාදනය සඳහා මුද්‍රණ ශිල්පයත්, පුස්තකාල කටයුතු පවත්වාගෙන යාමට අත්හුරු ක්‍රමය (Manual System) යොදා ගැනීමත් සිදු විය.

මෙම අවධිය යටතේ කඩදාසි මාධ්‍ය පමණක්ම නොව මැටි පුවරු පැපිරස්, පාර්ච්මන්ට්, වෙලම් යනාදි ප්‍රාථමික මාධ්‍ය සහ සමගාමී මාධ්‍ය යන ශ්‍රව්‍ය දෘශ්‍ය, සූක්‍ෂම රූපණ මාධ්‍ය භාවිතයත් ඇතුළත් වේ.

මෙම අවධියට සම්බන්ධ මූලික ලක්‍ෂණය වනුයේ, ප්‍රධාන තොරතුරු මාධ්‍ය ලෙස කඩදාසි මූලික වීමත්, පුස්තකාල මෙහෙයවීම් ක්‍රියාවලිය සඳහා තාක්‍ෂණය භාවිත නොවීමයි.

## ස්වයංක්‍රීය පුස්තකාල (Period of Automated Library)

පුස්තකාල තොරතුරු මාධ්‍ය මූලික වශයෙන් කඩදාසි මාධ්‍ය මත පදනම් වේ. කඩදාසි මාධ්‍යවලට අමතරව ශ්‍රව්‍ය දෘශ්‍ය, සූක්‍ෂම රූපණ, සංහිත තැටි (CD-ROM) යනාදි මාධ්‍යය සමගාමී මාධ්‍ය ලෙස මෙම අවධිය තුළ භාවිතා වේ.

මෙම අවධිය තුළ පුස්තකාල මෙහෙයවීම් ක්‍රියාවලිය පරිගණක පාදක තාක්‍ෂණය මත සිදු වේ. මේ අනුව බොහෝ කඩදාසි පුස්තකාල සවයංක්‍රීය පුස්තකාල බවට පරිවර්තනය වෙමින් තිබේ. පරිගණක තාක්‍ෂණය සහ සංහිත තැටි තාක්‍ෂණය සමාජගත වීම මෙම පුස්තකාල ක්‍රමවේදය බිහිවීමට හේතු විය. තොරතුරු නිෂ්පාදන සහ පාරිභෝජන ක්ෂේත්‍රයේ සුවිශේෂී වෙනස්කම් රාශියකට මෙම අවධිය පාදක වේ. තොරතුරු වැඩි ප්‍රමාණයක් අඩු ඉඩ ප්‍රමාණයක ගබඩා කිරීම, තොරතුරු ආරක්‍ෂා කිරීම, පහසුවෙන් කළමනාකරණය කිරීම සංඛ්‍යාක තොරතුරු නිෂ්පාදනය, මුද්‍රිත තොරතුරු සංඛ්‍යාක තොරතුරුවලට පරිවර්තනය මේ යටතේ පහසු කාර්යය වේ.

මෙම අවධියට අදාළ මූලික ලක්‍ෂණ වනුයේ තොරතුරු මාධ්‍ය මූලික වශයෙන් කඩදාසි මාධ්‍ය වීමත්, පුස්තකාල මෙහෙයුම් ක්‍රියාවලිය තාක්‍ෂණය මත සිදු වීමයි. එනම් පුස්තකාල මෙහෙයුම් ක්‍රියාවලිය සවංක්‍රීයකරණය වීමයි. මෙම පුස්තකාල ක්‍රමවේදය තුළ පුස්තකාල ආරම්භයේ දී විශාල ප්‍රාග්ධනයක් දැරීමට සිදු වුවත්, පසුකාලීනව පිරිවැය සූක්‍ෂම ක්‍රමයක් ලෙස භාවිත කිරීමේ හැකියාව ලැබී ඇත.

කඩදාසි පුස්තකාල ක්‍රමවේදය පරිදිම නොවූවත්, මෙම පුස්තකාල ක්‍රමවේදය භාවිතය සම්බන්ධව ද, ඊට අනන්‍ය වූ ප්‍රායෝගික ගැටලු රාශියක් වේ. මෙම තත්ත්වය හා සාපේක්‍ෂව තාක්‍ෂණයේ වූ පුරෝගාමී සංවර්ධන අතථ්‍ය පුස්තකාල බිහිවීමෙහිලා පදනම වී ඇත.

## අතථ්‍ය පුස්තකාල අවධිය (Period of virtual library)

උක්ත සමාජ සහ තාක්ෂණික ප්‍රවර්ධනයන්ට සාපේක්ෂව ගතික සංස්ථාවක් ලෙස , පුස්තකාලය පරිණාමය වීමේ ක්‍රියාවලියේ නවතම ප්‍රවේශය වනුයේ, නව සහශ්‍රය තුළ පුස්තකාලය තාත්විකත්වයෙන් මිදී, අතාත්වික පුස්තකාලයක ස්වරූපය ගැනීමයි.

මේ අනුව අතාත්වික පුස්තකාලය යනු 'ඉලෙක්ට්‍රොනික මෙහෙයුම් පද්ධතියකි. එය විසුරුණු ඉලෙක්ට්‍රොනික තොරතුරු සම්බන්ධ කෙරෙන සේවයකි. ඒ අනුව එය විද්‍යුත් තොරතුරු ප්‍රභව ජාලයක කේන්ද්‍රය ලෙස සැලකිය හැකිය" (යාපා, 2003, පි. 03).

"PC magazine encyclopaedia " හි අර්ථ දැක්වෙන පරිදි මෙය '' අන්තර් ජාලයේ ඇති මාර්ග ගත ග්‍රන්ථ, සඟරා, ලිපි ආදිය පිළිබඳ වු ලෝක ව්‍යාප්ත තොරතුරු එකතුවකි.
එසේම අතාත්වික, පුස්තකාලය හෙවත් සංඛ්‍යාංක පුස්තකාලය ''පරිගණක මගින් ප්‍රවේශ විය හැකි , සංඛ්‍යාංක ස්වරූපයෙන් තොරතුරු ගබඩා කළ හැකි එකතුවකි. මෙම සංඛ්‍යාංක අන්තර්ගතයන් ප්‍රාදේශීයව ගබඩා කළ හැකි අතර , පරිගණක ජාල ආශ්‍රිතව දුරස්ථව ගවේෂණය කළ හැකිය. එසේම මෙය තොරතුරු සමුද්ධරණ (Information Retrieval System) පද්ධති ක්‍රමයක් ලෙස ද වැදගත් වේ. (Wikipedia the face encyclopedia)

අතාත්වික පුස්තකාලය ''සංඛ්‍යාංක පුස්තකාලය'', ''විද්‍යුත් පුස්තකාලය'', "ඉලෙක්ට්‍රොනික පුස්තකාල'' යනුවෙන් ද නාමගත වේ. මේ මගින් විශ්ව ව්‍යාප්ත විද්‍යුත් තොරතුරු අන්තර්ජාලය හරහා විධිමත්ව සම්බන්ධ කෙරේ. මෙහි දී ''අධිවේගී සුපිරි තොරතුරු මාවතේ (information Snperhighway) පරිගණක විඥාපන හා සන්නිවේදන තාක්ෂණය සම්බන්ධිකරණය කරමින් තොරතුරු සමාජයක් ගොඩ නගනු ලබයි (Webster, 1995, p.9).

මේ අනුව කියවීම, අධ්‍යයනය, විමර්ශනය, පර්යේෂණය, පරිශීලනය, සඳහා ලිඛිත, මුද්‍රිත, මාධ්‍ය එක්රැස් කර, ගබඩා කර, ආරක්ෂාකර, සංවිධානය කර බෙදාහරින මධ්‍යස්ථානය ලෙස නාම ගත සම්ප්‍රදායික පුස්තකාලය පොත් එකතු, ස්ථාන, ගොඩනැගිලි , සීමා මායිම් නොමැති , විශ්ව තොරතුරු ජාලයක් බවට පත් වෙමින් පවතින බව පැහැදිලි කරුණකි. එනම් අතාත්වික පුස්තකාලය සංඛ්‍යාංක තොරතුරු නිෂ්පාදනය , විශ්ලේෂණය , ගබඩාකරණය , සමුද්ධරණය හා පරිවහනය කෙරෙන (Information Finding retrival) විද්‍යුත් දැනුම් මධ්‍යස්ථානයක් ලෙස සමාජගත වෙමින් පවතී.

## අතථ්‍ය පුස්තකාල සුවිශේෂතා

ඒ. එඩ්වඩ් ෆොක්ස් (A.Edward Fox) ආදි පරිගණක විශේෂඥයින් අර්ථ දක්වන පරිදි අතාත්වික පුස්තකාලය,

විසිරුණු පෙළ පාදක තොරතුරු එකතුවක්
විසුරුණු තොරතුරු සේවා එකතුවක්
විසිරුණු අන්තර් සම්බන්ධිත තොරතුරු සේවා අවකාශයක්
ජාලගත බහු මාධ්‍ය තොරතුරු එකතුවක් වශයෙන් සුවිශේෂ වේ. (Fox et.al , 1995 : 23)

මෙහිදී අතාත්තවික පුස්තකාලය සංකල්පීය, භෞතික, තාක්‍ෂණික, සංවිධානමය, කළමනාකරණමය යනාදි වශයෙන් සුවිශේෂී විභවතා සහිතව සම්ප්‍රදායික පුස්තකාලයෙන් වෙනස්ව හඳුනාගත හැකිය.

## 01) සංකල්පීය පසුබිම (Conceptual Background)

සම්ප්‍රදායික පුස්තකාල හුදෙක් භෞතික පුස්තකාල ආකෘතියකි. එය තථ්‍ය වශයෙන් පරිහරණය කළ හැකි, ස්පර්ශ කළ හැකි , දෘශ්‍යමාන වශයෙන් පවත්නා යථාර්ථයකි. එහෙත් අතාත්වික පුස්තකාල සංකල්පීය වශයෙන් තාර්කික පුස්තකාල ආකෘතියකි.

ජාල පද්ධතිගත සමාජයක අවසන් විකාශය "අතථ්‍ය යථාර්තය" (virtual reality ) ලෙස සැළකේ. අතථ්‍ය යථාර්ථය යනු සත්‍ය සේ පෙනෙන මායාවකි (රණසිංහ, 1998, පි. 14).

මේ අනුව අතථ්‍ය පුස්කොල සංකල්පිතය අතථ්‍ය යථාර්ථ පරිසර නිර්මාණයක් ලෙස සුවිශේෂිත වේ.

සම්ප්‍රදායික පුස්තකාල පරිසරය තුළ උපයෝජකයා භෞතිකව පුස්තකාල ප්‍රවේශය ලැබුව ද, අතථ්‍ය පුස්තකාල පරිසරය තුළ, අතාත්වික ප්‍රවේශයක් ලබනු ඇත. මේ තුළ සාමාන්‍ය මානව සමාජ සම්බන්ධතා සංකීර්ණ අධි මානව සම්බන්ධතා ජාලයකට බද්ධ වීමත්, යාන්ත්‍රිය සමාජ පරිසරයක් නිර්මාණය වීමත්, නියත යථාර්ථයක් වනු ඇත.

## 02) තොරතුරු මූලාශ්‍රය (Information Sources )

ලිඛිත, මුද්‍රිත සහ වෙනත් මාධ්‍යගත සම්ප්‍රදායික පුස්තකාල මාධ්‍ය වලින් පරිබාහිරව, ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ගත මූලාශ්‍ර අතථ්‍ය පුස්තකාල වල භාවිත වේ. "අන්තර් ජාලයේ අඩංගු මාර්ගත ග්‍රන්ථ, සඟරා, ලිපි ආදිය තොරතුරු මූලාශ්‍ර ලෙස භාවිත වේ. ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් ප්‍රලේඛන සහ පූර්ණ පෙළ සහිත ප්‍රලේඛන මෙන්ම දත්ත සමුදා, වෙබ් පිටු, තොරතුරු දොරටු, පෝටෙල් ආදි තොරතුරු ප්‍රභව" අතථ්‍ය පුස්තකාල සම්භාර වශයෙන් සුවිශේෂ වේ. (යාපා, 2003, පි. 3)

සම්ප්‍රදායික පුස්තකාල උපයෝජකයෙකුට ප්‍රාථමික , ද්විතියික , තෘතිය වශයෙන් ග්‍රන්ථ විද්‍යාමක තොරතුරු මූලාශ්‍ර පරිහරණයට ලැබෙන අවකාශයට වඩා වැඩි විභවතා සහිතව අතථ්‍ය පුස්තකාල උපයෝජකයෙකුට මෙහි දී තොරතුරු ගවේශණයට අවකාශ සැළසෙන බව පැහැදිලි කරුණකි. ඒ බව අතථ්‍ය පුස්තකාල මගින් මෙහෙයවෙන ප්‍රාථමික, ද්විතියික, තෘතිය යන විද්‍යුත් තොරතුරු ප්‍රභව සහ එහි කාර්ය භාරය ආශ්‍රයෙන් වඩාත් පැහැදිලි කරගත හැකිය.

### *2.1 ප්‍රාථමික තොරතුරු මූලාශ්‍රය (Primary Information Sourcess)*

තොරතුරු උපයෝජකයෙකුට දැනුම සහ තොරතුරු ලබාගත හැකි මූලික ප්‍රභව මෙයින් අදහස් වේ. ඒ අනුව ග්‍රන්ථයක්, සඟරා ලිපියක්, අන්තර්ගත තථ්‍ය ඉලෙක්ට්‍රොනික ප්‍රලේඛන හෝ වෙබ් පිටු වැනි අතථ්‍ය ඉලෙක්ට්‍රොනික ප්‍රලේඛන මේ යටතට ගැනේ. මෙම ප්‍රලේඛන වල ගවේෂකයෙකුට කියවා තේරුම් ගත හැකි තොරතුරු ඇතුළත් වේ. (යාපා, 2003, පි. 4)

### *2.2 ද්විතියික තොරතුරු මූලාශ්‍රය (Secondary information sources)*

ප්‍රාථමික තොරතුරු මූලාශ්‍ර වලට සෘජු ප්‍රවේශය ලබාදීම මෙමගින් සිදු කෙරේ. ඉලෙක්ට්‍රොනික ග්‍රන්ථ නාමාවලි , විමර්ශන ලැයිස්තු , පටුන පිටු , සූචි , සාරංශ , යනාදිය ද්විතියක මූලාශ්‍ර ලෙස වැදගත් වේ. මෙහිදී වෙබ් පිටුවක් යනු (Web Page) ප්‍රාථමික තොරතුරු මූලාශ්‍ර ගවේශණයට ඇති ද්විතිය තොරතුරු මූලාශ්‍රයකි. සම්ප්‍රදායික පුස්තකාල මූලාශ්‍රයකට වඩා ඉහළ කාර්යක්ෂමතාවයකින් වෙබ් පිටු හරහා ප්‍රාථමික මූලාශ්‍ර වලට ප්‍රවේශ විය හැකි වීම මෙහි සුවිශේෂත්වයකි. හයිපර් ලින්ක් (Hyperlink) සහිත විද්‍යුත් සූචියක් වෙබ් පිටු ලැයිස්තුවට අන්තර් ගත වීම නිසා උපයෝජක අවශ්‍යතා ඉටුකර ගැනීම මෙහිදී පහසු සහ සරල කාර්යයකි. විද්‍යුත් සඟරා තොරතුරු ගවේෂණයේදී , සඟරා පටුන පිටුවක සඳහන් සඟරා නාමයක් පාදක කරගෙන සඟරා ලිපියකට ප්‍රවේශ විය හැකි වීම මෙහිලා පැහැදිලි සංනිදර්ශනයකි.

### *2.3 තෘතීය තොරතුරු මූලාශ්‍රය (Tertary Information Sources)*

ප්‍රාථමික සහ ද්විතියික මූලාශ්‍ර වලට කඩිනම් සහ පහසු ප්‍රවේශය ලබාදීම මින් සිදු වේ. සෙවුම් යන්ත්‍ර හරහා ගවේෂණය කෙරෙන දත්ත සමුදා සහ පෝටෙල් (Data Bases and Portel) තෘතිය මූලාශ්‍ර ගණයට වැටේ. දත්ත සමුදා හෝ ද්විතියික තොරතුරු ප්‍රභව කාණ්ඩයක් සාමූහිකව ගවේෂණය කළ හැකි ඉලෙක්ට්‍රෝනික ප්‍රලේඛනයක් ලෙස, මෙහිදී පෝටෙල් වැදගත් වේ. එක් ගවේෂණයක් මගින් පෝටෙලයකට අයත් සමස්ත ද්විතියික තොරතුරු ගවේෂණය කළ හැකි වීමත්, ඒවා වෙන වෙනම ගවේෂණය කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනැගීමත් නිසා, තොරතුරු ගවේෂණයෙහිලා අතථ්‍ය පුස්තකාල ශක්‍යතාවය තාත්වික පුස්තකාලයකට වඩා ප්‍රශස්ත මට්ටමක පවතී.

## 03) පුස්තකාල භෞතික ස්වරූපය ( physical forms )

මුද්‍රිත හෝ මුද්‍රිත නොවන විවිධ මාධ්‍ය එකතු , පොත් රාක්ක , උපකරණ , විශාල ගොඩනැගිලි , විශාල කාර්ය මණ්ඩල සහිත සේවා පරිසරයක් තිබීම සම්ප්‍රදායික පුස්තකාල මුඛ්‍ය ලක්ෂණයකි.

අතාත්වික පුස්තකාලය උක්ත කී භෞතික පරිසරයෙන් පරිබාහිරව පරිගණක පාදකව දැනුම ගවේෂණය කළහැකි, දැනුම ගබඩා කළ හැකි, දැනුම සමුද්ධරණය හා බෙදා ගත හැකි විද්‍යුත් මෘදුකාංගගත පද්ධති පරිසරයක පැවතිම, ඒ අතර ව්‍යුහමය සුවිශේෂතාවයයි.

මේ අනුව සම්ප්‍රදායික පුස්තකාල එයට අනන්‍ය වූ භෞතික සීමා තුළ ක්‍රියාත්මක වන අතර, අතාත්වික පුස්තකාලය එම භෞතික සීමා අතික්‍රමණය කරමින් ක්‍රියාත්මක වනු හඳුනා ගත හැකිය.

## 04) තාක්ෂණික සුවිශේෂතා

අත්හුරු සහ යාන්ත්‍රික තාක්ෂණය මත පදනම්ව සියලු පුස්තකාල ක්‍රියාකාරකම් මෙහෙයවීම සම්ප්‍රදායික පුස්තකාල ලක්ෂණයකි.

සමස්ත පුස්තකාල ක්‍රියාවලිය තාක්ෂණික පදනමක් මත සිදුවීම සංඛ්‍යාංක පුස්තකාල ක්‍රමවේදයයි. මේ අනුව "සංඛ්‍යාංක පුස්තකාල ක්‍රමවේදය, සංඛ්‍යාංක පරිගණකකරණය, ගබඩාකරණය සහ සංනිවේදන යාන්ත්‍රණය සංකේන්ද්‍ර ගත වීමක් ලෙස සිදු වේ. (Gladney *et. al*. 1994, p. 102)

සම්ප්‍රදායික පුස්තකාල පරිසරය තුළ පවත්නා ඒක මාර්ගික විද්‍යුත් සංනිවේදන ක්‍රම අන්තර් ක්‍රියාකාරි සංනිවේදන ක්‍රම වේදයකට තාක්ෂණික වශයෙන් පරිවර්තනය වීම, සංඛ්‍යාංක පුස්තකාල වල සුවිශේෂි වෙනසකි.

"අද බහුල ප්‍රචලිතව පවත්නා ඒක මාර්ගික විද්‍යුත් සංනිවේදන ක්‍රම වෙනුවට , අන්තර් ක්‍රියාකාරි සන්නිවේදන ක්‍රම ජාල පද්ධතිගත සමාජයකදි අපේක්ෂා කළ හැකිය. සංනිවේදන මාධ්‍ය හා ග්‍රාහකයන් අතර ද්විපාර්ශ්වික හෝ බහු පාර්ශ්වික සබදතා ගොඩ නගා ගත හැකි වීම, මෙහිදි කැපී පෙනෙන ලක්ෂණයක් වනු ඇත (රණසිංහ, 1998, පි. 11)

මේ අනුව පැහැදිලි වනුයේ සංඛ්‍යාංක පුස්තකාල පරිසරය තුළ, තොරතුරු පරිභෝජනය සහ නිෂ්පාදනය හුදු තාක්ෂණික ක්‍රියාවලියක් ලෙසම සිදුවන බවයි.

## 05) තොරතුරු සඳහා ප්‍රවේශය (Access for Information)

තොරතුරු හෙවත් දැනුම අවශ්‍ය පාඨකයාට, අවශ්‍ය තොරතුරු, අවශ්‍ය අවස්ථාවේ, අවශ්‍ය පරිදි ලබා දීම පුස්තකාලයක අරමුණයි.

සම්ප්‍රදායික පුස්තකාලයක දි තොරතුරු මාධ්‍ය ලෙස පවතිනුයේ කඩදාසි, සූක්ෂම රූපණ, ශ්‍රව්‍ය දෘශ්‍ය ආදි භෞතික මාධ්‍ය වේ. මෙම මාධ්‍ය වලින් තොරතුරු ගවේෂණයේ දී විවිධ සීමාකාරී තත්වයන්ට මුහුණ දීමට සිදු වේ. මෙම මාධ්‍ය ගවේෂණයට යොදා ගැනෙන ප්‍රවේශ මාර්ග විෂය, කර්තෘ, ග්‍රන්ථ නාම වශයෙන් සිමිත ය. එසේම ප්‍රාථමික, ද්විතියික, තෘතිය වශයෙන් අවශ්‍ය වන තොරතුරු මට්ටම අනුව ගවේෂණයේ යෙදුනද, භෞතිකව ඒ සඳහා පවත්නා සම්පත් ප්‍රමාණය සහ අවස්ථා මත ගවේෂණ ප්‍රතිඵල සීමාකාරි වේ.

එහෙත් අතාත්වික පුස්තකාල පරිසරය තුළ, මෙම සීමාකාරි බාධක නොවේ. මෙහිදි තම අභිමතය පරිදි ප්‍රාථමික, ද්විතියික, තෘතිය තොරතුරු ප්‍රභව පරිශීලනය කළ හැකිය. අවශ්‍යතා පරිදි ප්‍රාථමික, මධ්‍යම නිපුන යන ඕනෑම ගවේෂණ යන්ත්‍රයක් ආශ්‍රිතව තොරතුරු ලබාගත හැකිය. ගවේෂිත තොරතුරු ප්‍රභව සංදර්ශනය සඳහා විවිධ විස්තර මට්ටම් වලින් යුතු නොයෙක් සංදර්ශන ආකෘති තෝරා ගැනීමට උපයෝජකයාට අවකාශය ලැබීම මෙහිදි සුවිශේෂයකි.

ඉලෙක්ට්‍රොනික පුස්තකාල වේදය තුළ භාවිත ''හයිපර්'' සහ ''ධුරාවලි' සම්බන්ධතා මගින් තොරතුරු ගවේෂණයට වඩාත් පහසුකම් සැපයේ. ධුරාවලි සම්බන්ධතා මගින් විද්‍යුත් ලේඛනයක විවිධ මට්ටම් කරා පිවිසීමටද හයිපර් ලින්ක් මගින් විද්‍යුත් ප්‍රලේඛනයක සිට තවත් විද්‍යුත් ප්‍රලේඛනයකට සෘජුව පිවිසීමටද අවකාශය සළසනු ලබයි.

මේ අනුව තොරතුරු හෙවත් දැනුම අවශ්‍ය උපයෝජකයෙකුට, අවශ්‍ය අවස්ථාවක, අවශ්‍ය ස්ථානයකදී, අවශ්‍ය පරිදි, අවශ්‍ය ස්වරූපයකින්, අවශ්‍ය මාධ්‍යයකින් පරිශීලනය කිරීමේ පූර්ණ ශක්‍යතාවයක් තිබීම අතාත්වික පුස්තකාලය ආශ්‍රිත සුවිශේෂී වර්ධනයකි.

අතථ්‍ය පුස්තකාල ක්‍රමය තුළ අභ්‍යන්තර සහ බාහිර වශයෙන් වූ ද්විත්ව තොරතුරු මාර්ග හරහා තොරතුරු සඳහා යොමු වීමට හැකි වීම ද විශේෂ වාසියකි. මෙහිදී අභ්‍යන්තර තොරතුරු ප්‍රභව ''පඨන මාත්‍ර' (Read Only) සහ ''සංශෝධනශීලී'' (Revisal) ප්‍රභව ලෙස භාවිතයට අවස්ථාව ඇත. ''පඨන මාත්‍ර ප්‍රභවයන් වෙනස් කළ නොහැකි අතර, ඒවායේ භාවිතය කියවීමට පමණක් සීමා වේ. සංශෝධනශීලී ප්‍රභව සංශෝධනයට හා කියවීමට ද හැකිය.'' (යාපා, 2003 , පි. 5)

තොරතුරු සඳහා 'කඩිනම් සහ පහසු ප්‍රවේශය' (Quick and easy access ) ලබා ගත හැකි වීමද, අතථ්‍ය පුස්තකාල සුවිශේෂී ලක්ෂණයකි.

''විවෘත සහ බහුවිධ ප්‍රවේශය'' (Open and multiple access ) අතාත්වික පුස්තකාල ආශ්‍රිත විශිෂ්ට ලක්ෂණයකි. මෙහිදී සම්ප්‍රදායික පුස්තකාලයකට සිය සේවා සම්පාදනයේදී පුස්තකාලය විවෘත කිරීම, වැසීම, සේවා සම්පාදනය ආදි වශයෙන් විවිධ සීමාකාරී සාධක වලට මුහුණ දීමට සිදුවීම යතාර්තයකි. එහෙත් ජාලගත පුස්තකාල තත්වයකදී දිවා රාත්‍රී භේදයෙන් තොරව ඕනෑම තොරතුරු උපයෝජකයෙකුට ස්ව අභිමතය පරිදි ඕනෑම දිනයක, දිනයේ ඕනෑම අවස්ථාවක, ලෝකයේ කුමන හෝ ස්ථානයක සිට දුරස්ථව විශිෂ්ට තොරතුරු ගවේෂණයක යෙදීමේ අවස්ථාව සැළසේ. බහුවිධ ප්‍රවේශය යටතේ එකම තොරතුරු සම්පතට වුවද, සමගාමීව බොහෝ දෙනෙකුට එකවර ප්‍රවේශ වීමේ අවස්ථාව සැලසෙනු ඇත.

ජාති, භාෂා, භූගෝලීය යනාදි වශයෙන් සම්ප්‍රදායික පුස්තකාල වලට විවිධ සීමාකාරී සාධක යටතේ ක්‍රියාත්මක වීමට සිදුවීම නියත සංසිද්ධියකි. එහෙත් අතථ්‍ය පුස්තකාල පරිසරයකදී ඒ සඳහා පහසුකම් ලැබී ඇති තත්වයක් තුළ වඩාත් ප්‍රජාතන්ත්‍රවාදි අකාරයෙන් තොරතුරු සඳහා යොමු වීමේ හැකියාව ඇත.

අතථ්‍ය ජාල ගත තොරතුරු පද්ධතියක් තුළ, ජාති, කුල, ගෝත්‍ර, රාජ්‍යමය යනාදි බෙදීම් අවම වී මිනිසා ''විශ්ව මිනිසෙක්' ලෙස සමාජාරෝපණය වීම සිදු වනු ඇත. ජාතිකත්වය අභිබවා ''ජාත්‍යන්තරවාදය'' (Internationalism) විශ්වයේ තීරක බලවේගයක් වීමට ද මෙම තත්වය බලපානු ඇත.

## 06) තොරතුරු ගබඩාකරණය (Information Storage )

දැනුම නිෂ්පාදනයට සාපේක්ෂව අනාගත ප්‍රයෝජනය උදෙසා දැනුම ගබඩාකරණය වත්මන් පුස්තකාල ආශ්‍රිත ප්‍රබල ගැටලුවකි. හේතුව සම්ප්‍රදායික පුස්තකාල වල ගබඩාකරණ ඉඩ සීමිත වීමයි. තාත්වික පුස්තකාල වල භෞතික වශයෙන් තැන්පත් කෙරෙන දැනුම හෙවත් තොරතුරු අතාත්වික පුස්තකාල වල සංඛ්‍යාංක වශයෙන් සුළු ඉඩ පරාසයක ගබඩා කළ හැකිය. නව සහශ්‍රය තුළ අධි ධාරිතාවයකින් දැනුම ගබඩා කෙරෙන ප්‍රකාශ තැටි (optic disk) තාක්ෂණය සමාජගත වෙමින් පවති. මෙ අනුව 'ප්‍රකාශ ගබඩාකරණ තාක්‍ෂණය (Optical Storage technology) මගින් තොරතුරු ගබඩාකරණ ගැටලු මත සීමා වී ඇති වත්මන් පුස්තකාල සේවා නව දිශානතියකට යොමු වනු ඇත.

## 07) තොරතුරු සහ දැනුම කළමනාකරණය

වත්මන් සමාජ ක්‍රියාවලිය තුළ දැනුම හෙවත් තොරතුරු නිෂ්පාදනය අසීමිතව සිදු වෙමින් පවති. මේ අනුව ලොව පුරා මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය, චුම්භක හා ඉලෙක්ට්‍රොනික වශයෙන් නිපදවෙන ගිගාබයිට් 1.5 ක පමණ වූ සමස්ත දැනුම් ප්‍රමාණය කළමනාකරණය සංකීර්ණ ගැටලුවකි. එසේම පවත්නා තොරතුරු අධි වේගයෙන් යාවත්කාලීන (update) වෙමින් පවතින අතර, ඇතැම් තොරතුරු යල් පැනයාම මත නිෂේධ වෙමින් පවති. මේ අනුව පවත්නා දැනුම තෝරා බේරා ගෙන පරිභොජනය කිරීම ගැටලු සහගතය.

මෙහිදී තොරතුරු නිෂ්පාදනයට සාපේක්ෂව තොරතුරු පරිභෝජනය සිදු වීමට නම්, නව ග්‍රන්ථ විද්‍යා පරිපාලන ක්‍රම වේදයක (bibliographical control) අවශ්‍යතාව උද්ගත වෙමින් පවති. අතථ්‍ය පුස්තකාල ක්‍රමය තුළ සමස්ත විශ්ව දැනුම සංඛ්‍යාංක බවට පරිවර්තනය කර ජාලගත කිරීමේ හැකියාව පැවතීමත්, අඛණ්ඩව තොරතුරු යාවත්කාලීන කිරීමට හැකි වීමත්, නව දත්ත ප්‍රතිග්‍රහනය, සංස්කරණය, සංශෝධනය පහසු වීමත් යනාදි හේතු මත තථ්‍ය පුස්තකාලයට වඩා අතථ්‍ය පුස්තකාලයකට ගතික සංස්ථාවක් ලෙස වර්ධනය වීමේ සුවිශේෂ ඉඩකඩක් ඇති බව පෙනේ. එසේම නව යාන්ත්‍රීය තොරතුරු ගවේෂණ ක්‍රම ආශ්‍රිතව දැනුම කළමනාකරණය කාර්යක්‍ෂමව හා කාර්යඵලදායිව කළ හැකි බව ද පැහැදිලි ය.

## 08) පුස්තකාල හා තොරතුරු විද්‍යා ක්ෂේත්‍රයෙහිලා බලපෑම

අතාත්වික පුස්තකාල ක්‍රම වේදය පුස්තකාල හා තොරතුරු විද්‍යාවේ සමස්ත විෂය සීමා අතික්‍රමණයට බලපාන බව පැහැදිලි කරුණකි. පුස්තකාල විද්‍යාව විඥාපන විද්‍යාවක් සහ තාක්‍ෂණික කාර්ය භාරයක් බවට පරිවර්තනයට, මෙය බලපානු ලබන බව පෙනේ.

සම්ප්‍රදායික පුස්තකාලයාධිපතිවරයාගේ කාර්ය භාරය නිෂේධ වී, ඔහුගේ කාර්ය භාරය තොරතුරු විද්‍යාඥයෙකුගේ තත්වයට විස්ථාපනය වීමද, මෙහි සුවිශේෂී ප්‍රගමනයකි. මේ අනුව ඔහු වෙබ් පිටු සම්පාදක වරයෙකු ඉලෙක්ට්‍රොනික ප්‍රතිබිම්බකරණ, සංරක්‍ෂණ සහ ජාල කරණ විශේෂඥයකු බවට පත්වනු ඇත.'' (අමරවීර, 2003)

සම්ප්‍රදායික පුස්තකාල විද්‍යාවේ විෂය සීමා උඩුයටිකුරු වීමද, මෙහි සුවිශේෂී ප්‍රවර්ධනයකි. ඒ අනුව වර්ගීකරණය, සූචිකරණය, අනුක්‍රමනිකාකරණය, සම්භාර ප්‍රතිග්‍රහණය, දැනුම කළමනාකරණය යනාදි විෂය ක්ෂේත්‍ර සුවිශේෂී වෙනස්කම් වලට ලක්වනු ඇත.

සම්ප්‍රදායික පුස්තකාල කළමනාකරණය නව දිශානතියකට යොමු වීමද, මෙහිදී ප්‍රබල වෙනසකි. සම්ප්‍රදායික පුස්තකාලය පොදු අයවැයක් හෝ යම් ආයතනයක් මත රැඳෙමින් පෝෂණය වීම පවත්නා යථාර්ථයකි. එහෙත් අතාත්වික පුස්තකාලය ඉන් පරිබාහිරව "සාමාජිකත්වය (member ship ) දායක මුදල් (subscription ) සහ සේවා ගාස්තු (Service - fees) මත සහාය ලබමින් වැඩෙන ගතික තත්වයක්" පිළිබිඹු කරයි. (Kahin - 1996)

තාත්වික පුස්තකාලය මිනිසා විසින් නිෂ්පාදිත භෞතික ද්‍රව්‍ය අන්තර් ගත භෞතික පරිසරයක් ලෙස ද, අතාත්වික පුස්තකාලය අතාත්වික ද්‍රව්‍ය පූර්ණ ලෙස ස්ථානගත මෘදුකාංග පරිසරයක් ලෙස ද, සුවිශේෂී වෙනසක් ජනික කරයි. මේ අනුව මෙම පුස්තකාල ක්‍රමවේද ද්විත්වය අතර සුවිශාල පරතරයක් විශද කරනු හඳුනා ගැනීමට ඇත.

## සමාලෝචනය

තොරතුරු නිෂ්පාදනය සහ පරිභෝජනය මූලික සමාජ කාර්ය බවට පරිවර්තනය කෙරෙන තොරතුරු මූල සමාජයක් (Information based Society ) අද සමස්ත සමාජ ක්‍රමය තුළ උත්පාද වෙමින් පවතින බව පැහැදිලි යථාර්ථයකි.

මෙම පසුබිම මත උක්ත සංයුක්ත ගත කරුණු සන්සන්දනාත්මකව විශ්ලේෂණය කර බලන විට පැහැදිලි වන මූලික කරුණක් වනුයේ, සම්ප්‍රදායික පුස්තකාලය නව සහශ්‍රය තුළ සුවිශේෂී පරිණාමයකට ලක් වෙමින් පවත්නා බවයි. එනම් සම්ප්‍රදායික පුස්තකාලය ජාල පද්ධති ගත අතථ්‍ය පුස්තකාල ක්‍රමවේදය තුළ, ක්‍රමයෙන් නිෂේධ වෙමින් පවත්නා බවයි.

මේ අනුව නව සහශ්‍රය උත්පාද වෙමින් පවත්නා තොරතුරු සමාජය තුළ පුස්තකාල සේවය සංකල්පීය සහ වාස්තවික වශයෙනුත්, ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙනුත්, තාක්ෂණික හා යාන්ත්‍රික වශයෙනුත්, ප්‍රවර්ධනය කෙරෙන සුවිශේෂී සන්ධිස්ථානයක් ලෙස හඳුනාගත හැකිවනු ඇත.